# මාධ්‍ය ප්‍රකාශනය

# ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ දර්ශකයහි සොයාගැනීම්හි සාරාංශය - දෙසැම්බර් 2023

## හැඳින්වීම

මෙම වාර්තාව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ දර්ශකයේ (පස්වැනි අදියරයේ) සොයාගැනීම් පදනම් කරගෙන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් විසින් සකසන ලද්දකි. වික්‍රමසිංහ ආණ්ඩුව ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට බව පෙනෙන පරිදි ආර්ථික හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ දිගටම සිදු කරන බව දක්නට හැකිය. අර්බුදයට වගකිව යුත්තේ සාමාන්‍ය පුරවැසියන් නොවුනත්, එය විසඳීමට රජය ගෙන ඇති ක්‍රියාවලියේ බර දැරීමට ඔවුන්ට සිදු වී ඇත. එවැනි පසුබිමක් තුළ, රටේ වත්මන් පාලන තත්ත්වය පිළිබඳ මහජනතාවගේ අදහස ග්‍රහණය කර ගැනීමේ අරමුණින් මෙම මත විමසුම සැලසුම් කරන ලදී.


## ක්‍රමවේදය

මෙම පර්යේෂණය අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් හතරෙන් (සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්) නියැදි ප්‍රතිචාර දැක්වූවන් 1350 ක් සමඟ සිදු කරන ලදී. නියැදි ස්ථාන තේරීම සඳහා බහු-අදියර අහඹු ස්ථර නියැදි ක්‍රමයක් භාවිතා කරන ලද අතර, නියැදි ස්ථාන තුළ අහඹු ක්‍රමයක් භාවිතයෙන් ප්‍රතිචාර දැක්වූවන් තෝරා ගන්නා ලදී. නියැදිය දිස්ත්‍රික්ක 25 තුළම නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන පුරුෂයන් සහ ස්ත්‍රීන්ගෙන් සමන්විතය. මෙම ජාතික මත විමසුම සඳහා ක්ෂේත්‍ර කටයුතු 2023 නොවැම්බර් 6 වන දින සිට 23 වන දින දක්වා පවත්වන ලද අතර, ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙහි ක්ෂේත්‍ර සමීක්ෂකයන් 80 ක් (පුරුෂයන් සහ ස්ත්‍රීන්) යොදා ගන්නා ලදී. ජනගහනයේ දිස්ත්‍රික්ක සහ ජනවාර්ගික අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇති අතර, සමාජ විද්‍යාව සඳහා වන සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී.


## සොයාගැනීම්

### වත්මන් රජය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රධාන ඉල්ලීම් පිළිබඳ මහජන මතය

ප්‍රස්ථාර අංක 01 - ප්‍රධාන ඉල්ලීම් පිළිබඳ මහජන මතය




ප්‍රස්ථාර අංක 02 - ප්‍රධාන ඉල්ලීම් පිළිබඳ මහජන මතය - වයස අනුව




ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් දේශපාලන නායකත්වයේ වගවීම වැඩි දියුණු කරන ලෙස ඉල්ලා සිටිති. නිදසුනක් වශයෙන් සියලුම ප්‍රතිචාරකයන් ඉල්ලා සිටින්නේ, ආර්ථික අර්බුදයට වගකිව යුත්තන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම/ වගවීමට ලක් කිරීම ඇති කළ යුතු බවයි. එසේම ජනාධිපතිවරයා ඇතුළු සියලුම දේශපාලනඥයන් තම වත්කම් හෙළිකළ යුතු බව ද ඔවුහු අවධාරණය කරති. ඊට අමතරව ප්‍රතිචාරකයින් ඉල්ලා සිටින්නේ නියමිත වේලාවට මැතිවරණය පැවැත්විය යුතු බවත්, සියලුම දේශපාලනඥයන් විගණනය කළ යුතු බවත්, සහ ඔවුන්ගේ විගණනය නොකළ වත්කම් රජය විසින් රාජසන්තක කළ යුතු බවත්ය. ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ට (අවුරුදු 30ට වැඩි) වඩා තරුණ තරුණියන් අතර දේශපාලන නායකත්වයේ වගවීමක් සඳහා වන ඉල්ලීමට වැඩි ප්‍රමුඛත්වයක් පවතියි. උදාහරණයක් ලෙස, වයස අවුරුදු 18ත් 29ත් අතර වයස් සීමාවේ අයගෙන් 97%ක් ප්‍රකාශ කරන්නේ ආර්ථික අර්බුදයට වගකිවයුත්තන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට/ වගවීමට ලක් කිරීමට පියවර ගත යුතු බවයි.


එවැනිම සමාන ප්‍රතිශතයකින් යුතු තරුණ තරුණියන් විසින් ඉල්ලා සිටින්නේ ජනාධිපතිවරයා ඇතුළු සියලුම දේශපාලඥයින් ඔවුන්ගේ වත්කම් හෙළි කළ යුතු බවයි. තවද, තරුණ තරුණියන්ගෙන් 93%ක් විශ්වාස කරන්නේ සියලුම දේශපාලනඥයන් විගණනයට ලක් කළ යුතු බවත්, ඔවුන්ගේ විගණනයට ලක් නොවන වත්කම් රාජසන්තක කළ යුතු බවත්ය.

### දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය

ප්‍රස්ථාර අංක 03 - දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය




ප්‍රස්ථාර අංක 04 - දූෂණ මට්ටම පිළිබඳ මහජන මතය - වයස සහ ප්‍රදේශය අනුව




මෙම සමීක්ෂණයෙන් වැඩිදුරටත් අනාවරණය වුයේ ආර්ථික අර්බුදයට පෙර කාලයට සාපේක්ෂව රටේ දූෂණ මට්ටම වැඩි වී ඇතැයි ශ්‍රී ලාංකිකයන්ගෙන් අති බහුතරයක් විශ්වාස කරන බවයි. මෙම මතය සියලුම වයස් කාණ්ඩවල සහ නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශයන්හි සිටින පුද්ගලයින් අතර දක්නට ලැබෙයි.

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ මහජන මතය

ප්‍රස්ථාර අංක 05 - ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ දැනුවත්භාවය




වික්‍රමසිංහ ආණ්ඩුවේ යෝජිත නීති සම්පාදනයඃ යෝජිත ත්‍රස්ත විරෝධී පනත සහ මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ ප්‍රතිචාර දැක්වීමේදී, ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් ප්‍රකාශ කළේ මෙම යෝජිත පනත් කෙටුම්පත් දෙකම පිළිබඳ තමන්ට දැනුවත්භාවයක් නොමැති බවයි. දැනුවත්භාවයක් ඇති බව ප්‍රකාශ කරන පිරිසෙන්, සියලුම වයස් කාණ්ඩවල 40% ක් ත්‍රස්ත විරෝධී පනත පිළිබඳ දැනුවත්භාවයක් ඇති බව පවසයි. නමුත් එයට ප්‍රතිවිරුද්ධව, මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳ දැනුවත්භාවය ප්‍රකාශ කළ ප්‍රතිශතය (20%-30%) අවම වේ.


යෝජිත ත්‍රස්ත විරෝධී පනත පිළිබඳ දැනුවත්භාවයක් ඇති ප්‍රතිචාරකයන්ගෙන් (38.5%) බහුතරයක් (72.6%) ක් පනත අනුමත නොකරන අතර, බලයේ සිටින අය එය තම ප්‍රයෝජනය සඳහා අනිසි ලෙස භාවිතා කරනු ඇති බව මෙන්ම එය මානව හිමිකම් කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරයි යන කරුණු හේතු කරගෙන මෙය අනුමත නොකරන බව දක්වයි. එසේම, යෝජිත මාර්ගගත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳව දැනුවත්භාවයක් ඇතැයි දැක්වූ ප්‍රතිචාරකයන්ගෙන් (28.4%) බහුතරයක් (71.1%) පනත අනුමත නොකරන අතර, බලයේ සිටින පුද්ගලයන් තම වාසිය සඳහා එය අවභාවිතා කරනු ඇතැයි යන්නත්, පවතින නීති ප්‍රමාණවත් බව සහ මේ මොහොතේ නව නීති සම්පාදනයක අවශ්‍යතාවයක් නොමැති බවත් අනුමත නොකිරීමට හේතු ලෙස උපුටා දක්වයි.

## පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ මහජන මතය

ප්‍රස්ථාර අංක 06 - පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ මහජන මතය



ප්‍රස්ථාර අංක 07 - පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ මහජන මතය - ආගම අනුව





ශ්‍රී ලංකා රජය විසින් පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සහ එයට වගකිව යුත්තන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම/ අදාළ පාර්ශවයන් වගවීමට ලක් කිරීම සම්බන්ධයෙන් කතෝලික සභාවේ කලකිරීම පිළිබිඹු කරමින් අති බහුතරයක් (89.6%) තම අතෘප්තිය ප්‍රකාශ කරති. සියලුම ආගමික ප්‍රජා කණ්ඩායම් හතරෙන්ම මෙම අදහස ඉදිරිපත් කරයි.


පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයහි විමර්ෂණ පිළිබඳව විවිධ පාර්ශව විසින් විවිධ අදහස් පළකරන අතර, 34.4% ක් විශ්වාස කරන්නේ සිද්ධිය සම්බන්ධයෙන් ජාත්‍යන්තර විමර්ෂණයක් පැවැත්විය යුතු බවයි. තවත් 32.8% ක් ජාත්‍යන්තර නිරීක්ෂකයින් සමග අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු බව අවධාරණය කරන අතර, 21.8% ක් අභ්‍යන්තර පරීක්ෂණයක් පමණක් ප්‍රමාණවත් යැයි විශ්වාස කරති. කෙසේ වෙතත්, ක්‍රිස්තියානි ප්‍රජාවේ සැලකිය යුතු ප්‍රතිශතයක් (රෝමානු කතෝලික සහ රෝමානු නොවන කතෝලික) පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ජාත්‍යන්තර විමර්ෂණයක් පැවැත්විය යුතු බව ඉල්ලා සිටීම තුළින් පෙන්නුම් කරන්නේ, මෙම කාරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර මැදිහත්වීමක් පමණක් සිදුවීම පිළිබඳ ඔවුන්ගේ අවිශ්වාසක් පවතින බවයි.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි යෝජිත ප්‍රතිපත්ති වෙනස්කම්/ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන මතය**

ප්‍රස්ථාර අංක 08 - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි යෝජිත ප්‍රතිපත්ති වෙනස්කම්/ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය




ප්‍රස්ථාර අංක 09 - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි යෝජිත ප්‍රතිපත්ති වෙනස්කම්/ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය - වයස සහ ප්‍රදේශ අනුව




සමීක්ෂණ සොයාගැනීම්වලට අනුව, ශ්‍රී ලංකාවට ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා මූල්‍ය ආධාර සැපයීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් යම් ප්‍රතිපත්ති වෙනස්කම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ යෝජනා කර ඇති බව තමන් දැනුවත් යැයි ශ්‍රී ලාංකිකයන්ගෙන් 60.2% ක් ප්‍රකාශ කරති. සුවිශේෂී කරුණක් වන්නේ, මෙම දැනුවත්භාවය, සාපේක්ෂව ග්‍රාමීය ජනතාව අතර ඉහළ මට්ටමක පැවතීමයි. දැනුවත්භාවයක් ඇති පිරිසෙන් 68.9% ක් පමණ විශ්වාස කරන්නේ, ශ්‍රී ලංකාවට වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා මෙම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්ති වෙනස්කම්/ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැදගත් බවයි. මෙම දෘෂ්ටිකෝණය සියලුම වයස් කාණ්ඩයන් සහ නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ යන දෙඅංශයෙන්ම 60%කට වැඩි පිරිසකගේ පවත්නා බව දක්නට හැකිය.